**ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය - 2020**
**-------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**---------------**

1.1 මතය
--------

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍යතත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**
------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**
------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනයේ ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනයේ ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට කළුතර රියදුරු පුහුණු පාසලින් රු 10,921,893.ක මුදලක් වසරකට වැඩි කාලයක සිට අයවිය යුතුව පැවතියද එම මුදල් අයකර ගැනීමට වෛද්‍ය ආයතනයේ අවධානය යොමු වී නොතිබුණි. | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කළුතර රියදුරු පුහුණු පාසලෙන් 2020.12.31 දිනට ලැබිය යුතු මුදල රු.10,921,893ක මුදලකි. මෙම මුදල කොටස් දෙකකින් සමන්විත වන අතර, ඒවා පිළිවෙළින් ආරක්ෂක ගාස්තු රු.10,381,893.48 හා ගොඩනැගිලි කුලිය රු.540,000 කි. 2016.09.07 වන දින ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ එවකට සිටි සභාපතිතුමා විසින් ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ ආරක්ෂක ගාස්තුවෙන් 1/5 ක කොටසක් ගෙවීමට එකඟ වී ඇති බවට ලිඛිතව දන්වා ඇත. ඒ අනුව, අප ආයතනය විසින් පිළිවෙළින් 2018.10.25 දින, 2019.09.20 දින, 2020.11.25 දින සහ 2021.11.27 දිනැති ලිපි මගින් ශ්‍රී ලංකා මධ්‍යම රියදුරු අභ්‍යාස විද්‍යාලයට හා ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය වෙත ලිපි යොමු කොට ඇත. නමුත් මේ දක්වා කිසිදු ලිඛිත ප්‍රතිචාරයක් ලැබී නොමැත. | ලැබිය යුතු මුදල කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1997අංක 25 දරන ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනතේ 3(අ) වගන්තිය | වෛද්‍ය ආයතනය පනතට පටහැනිව 2020 වර්ෂයේ දී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ හා ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ සේවකයින් සඳහා පිළිවෙලින් රු.1,988,954 ක හා රු.185,932 ක වෛද්‍ය පහසුකම් හා ඖෂධ ණය පදනම යටතේ සපයා තිබුණි. | අදහස් දක්වා නොමැත. | ආයතනය පනතට අනුකූලව කටයුතු කළ යුතු වේ. |
| (ආ) 1997 අංක 25 දරන ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනතේ 3 වන වගන්තිය අනුව ඉටුකල යුතු පහත සඳහන් කාර්යයන් ඉටුකර නොතිබුණි . | | | |
| | i. ආයතනය විසින් කවර හෝ වර්ගයක මෝටර් වාහනවලට අදාළ අනතුරු හා සම්බන්ධ අවස්ථාවලදී වෛද්‍ය සේවා හා ආධාර සැලසීම කළ යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි. | දැනටමත් ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩල සේවකයන් සම්බන්ධව ගෙවිය යුතු වන්දි හෝ අලාභ ප්‍රමාණය පිලිබඳ නිර්දේශ ලබා දීම සිදු වන අතර, මේ සඳහා ලිපි ගොනුවක් පරිපාලන අංශය මගින් නඩත්තුවේ. | ආයතනයේ පනත ප්‍රකාරව කාර්යයන් ඉටුකළ යුතු වේ. |
| | ii. ගෙවිය යුතු වන්දි හෝ අලාභ ප්‍රමාණය පිළිබඳ උපදෙස් හා විශේෂ ගුරු උපදේශ ලබාදීම සිදු කළ යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි. | නමුත් මේ වන විට සෑම දිස්ත්‍රික්කයටම ශාඛා කාර්යාලයක් පවතින බැවින් වෛද්‍ය නිලධාරී | ආයතනයේ පනත ප්‍රකාරව කාර්යයන් ඉටුකළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | | මණ්ඩලයක් පත් කිරීම අවශ්‍ය වන්නේ නැත. | |
| | iii. කාර්මික ස්වස්ථතාව සහ කාර්මික අනතුරු පිළිබඳව වෛද්‍ය උපදෙස් හා නිර්දේශ ලබාදීම සිදු කළ යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි. | දැනටමත් ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය මගින් ප්‍රතිකාර ගැනීම සඳහා යොමුවන සේවාලාභීන්ගේ කාර්මික ස්වස්ථතාව සහ කාර්මික අනතුරු වැලැක්වීම පිළිබඳව වෛද්‍ය උපදෙස් හා නිර්දේශ ලබා දිම සිදු වේ. | ආයතනයේ පනත ප්‍රකාරව කාර්යයන් ඉටුකළ යුතු වේ. |
| | iv.සියලු විස්තරවලට අයත් මෝටර් වාහන, ශාරීරිකව හෝ මානසික යෝග්‍ය හා ප්‍රවීණ තැනැත්තන් විසින් පමණක් ධාවනය කරනු ලබන හෝ පදවන ලබන බවට ආයතනය විසින්ම හෝ වෙනත් නියෝජිතායතන විමසා හෝ වගබලා ගැනීම හා අදාල ක්‍රියාත්මක කිරීම් බලධරයන් විසින් පිළිගත යුතු හා ක්‍රියාත්මක කළ යුතු, ප්‍රවාහන වෛද්‍ය කටයුතුවල ප්‍රමිත සකස් කිරීම සහ සීමා නියම කිරීම. | ප්‍රවාහන වෛද්‍ය කටයුතුවල ප්‍රමිති හා නිර්ණායක සකස් කිරීම මීට වසර ගණනාවකට ඉහත දී විශේෂඥ වෛද්‍ය විද්‍යාල සමඟ සාකච්ඡා කොට පිළියෙල කර ඇත. | ආයතනයේ පනත ප්‍රකාරව කාර්යයන් ඉටුකළ යුතු වේ. |
| (ආ) 2003 ජුනි 02 දිනැති පීඊඩී/12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| 9.12 වගන්තිය | මහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේදී රු.5,628,005 ක මුදලක් සෞඛ්‍ය රක්ෂණ ආවරණයක් ලබා ගැනීම සඳහා ගෙවා තිබුණි. | අදහස් දක්වා නොමැත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් | | | |

| | | | |
|---|---|---|---|
| රෙගුලාසි සංග්‍රහය | | | |
| මු.රෙ (5)371 | මුදල් රෙගුලාසි ප්‍රකාරව අත්තිකාරම් මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පියවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ ලබාදී තිබූ රු.479,080 ක නොපියවූ අත්තිකාරම් ශේෂයක් පැවතුණි. | අදහස් දක්වා නොමැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 290,189,169 ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. 451,929,472 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.161,740,303 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වෛද්‍ය සේවා ආදායම රු.168,587,470 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

- සමාලෝචිත වර්ෂයේදී ඉකුත් වර්ෂයට සාපේක්ෂව වෛද්‍ය ආයතනයේ ප්‍රධාන ආදායම් තුළ ඇතුළත් සැහැල්ලු වාහන පරීක්ෂා කිරීමේ ආදායම්, බර වාහන අලුත්කිරීමේ වෛද්‍ය ගාස්තු ආදායම්,රසායනාගාර පරීක්ෂණ ආදායම් සහ වෛද්‍ය කඳවුරු ආදායම් පිළිවෙලින් සියයට 20 කින්,සියයට 42 කින්, සියයට 49කින් හා සියයට 100 කින් අඩුවී තිබුණි.
- ආයතනයේ වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීමේ වියදම් 2019 වර්ෂයට සාපේක්ෂව 2020 දී සියයට 48 කින් වැඩිවී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1997අංක 25දරන ජාතික ප්‍රවාහන ආයතන පනත අනුව ප්‍රවාහන ආයතනය විසින් රියදුරු බලපත්‍ර අපේක්ෂකයින් සඳහා උස, බර, එක්ස්රේ පරීක්ෂාව, රුධිර සීනි මට්ටම, රුධිර පීඩන පරීක්ෂාව හා ඇස් පරීක්ෂාවන් සිදුකරනු ලැබුවද රියදුරු බලපත්‍ර ලබාදීම සඳහා අවශ්‍ය ප්‍රමිත නිර්ණායකයන් හඳුනාගෙන වෛද්‍ය සහතික නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | සියලුම පරීක්ෂණ සඳහා ප්‍රමිති හා නිර්ණායකයන් හඳුනාගෙන ඇති අතර එමගින් සෑම ශාඛාවකම එකම ක්‍රමවේදයකට අනුව වෛද්‍ය සහතික නිකුත් කිරීම සිදු වේ. | රියදුරු බලපත්‍ර ලබාදීමට අවශ්‍ය ප්‍රමිත නිර්ණායක හඳුනාගෙන වෛද්‍ය සහතික නිකුත් කිරීමට කටයුතු කළ යුතුවේ. |

### 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කරන ලද ආයතනයේ කාර්ය මණ්ඩලය 454 කින් යුක්ත වුවද 2020 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව 317 ක් විය. ඒ අනුව සේවකයින් 74 ක් පුරප්පාඩුව පැවතුණි. එසේම ආයතනයේ ස්ථිර බඳවා ගැනීම් වලට අමතරව කොන්ත්‍රාත්, අනියම්, දෛනික හා පැය පදනම යටතේ සේවකයින් යොදවා තිබුණි . තවද 2020 දෙසැම්බර් 31 දිනට වෛද්‍යවරු 61ක් පුරප්පාඩු වී පැවතුණි. | ආයතනයේ මේ වන විටත් වෛද්‍ය නිලධාරීන්ගේ රැකියා පුරප්පාඩු රාශියක් ඇත. මීට මූලික හේතුව ඔවුන් සඳහා ගෙවනු ලබන වැටුප ඉතා අඩුවීමයි. | කාර්ය මණ්ඩල පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු කළ යුතු වේ. |

### 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය සහ 2003 ජුනි 02 දිනැති PED/12 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ව්‍යවස්ථාපිත මණ්ඩලවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2020 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ මාස 07 ක් දින 04 ප්‍රමාද වී 2021 ඔක්තෝබර් 04 දිනදීය. | පිළිතුරු සපයා නොමැත. | ගිණුම් ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණනයට ඉදිරිපත් කළ යුතු වේ. |

### 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආයතනය විසින් අපේක්ෂිත අරමුණු වලට අදාල වන සේ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි. | සේවාලාභීන් හට කාර්යක්ෂම හා තෘප්තිමත් සේවාවක් සැපයීම අරමුණු කොට ගෙන ක්‍රියාකාරී සැළැස්ම පිළියෙල කර ඇත. | අරමුණු වලට අනුකූලව ක්‍රියාකාරී සැළැස්ම පිළියෙල කළ යුතු වේ. |